**අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය - 2023**

1. **ජ්‍යෙෂ්ඨතාවය** — උපරිම ලකුණු 45

ශ්‍රී ලං.අ.ප.සේ. සේවා ව්‍යවස්ථාව ප්‍රකාර මූලික සුදුසුකම් යටතේ දක්වා ඇති ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ අනිවාර්ය වසර 05 ක සේවා කාලයට අතිරේකව ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයට වසරකට ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 අනුව සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වැඩිම අමතර සේවා කාලය සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ද ලකුණු හිමි වන පරිදි ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ.

සටහන : ශ්‍රී ලං.අ.ප.සේ. II ශ්‍රේණියේ වසර 02ක සේවා කාලයක් සහිතව II සහ III ශ්‍රේණි වල වසර 12කට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරාලීමෙන් පසුව I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති නිලධාරීන්ගේ, එම මුළු සේවා කාලය වසර 12ට සහ II ශ්‍රේණියේ වසර 02ට වඩා වූ අමතර සක්‍රිය හා සතුටුදායක සේවා කාලය ද I ශ්‍රේණියේ සේ සලකා ලකුණු ලබා දෙනු ලැබේ.

2. **අධ්‍යාපන සුදුසුකම්** — උපරිම ලකුණු 20

| | |
|---|---|
| 2.1 දර්ශනශූරි (PhD) | - ලකුණු 20 |
| 2.2 දර්ශනපති (M Phil) | - ලකුණු 15 |
| 2.3 පශ්චාත් උපාධිය | - ලකුණු 12 |
| 2.4 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | - ලකුණු 08 |

(කාර්යක්ෂමතා කඩඉම්වලින් නිදහස් කිරීමට සලකා බලන ලද සුදුසුකම් හැර වෙනත් අධ්‍යාපන සුදුසුකම් පමණක් ඉහත ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන අතර එක් සහතිකයකට / ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. තව ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල / ආයතන වෙතින් හදාරා ඇති සේවා ව්‍යවස්ථාවේ සඳහන් වන හෝ අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලබන අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් අදාළ ලකුණු ලබා දෙනු ලැබේ)

3. **පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම** — උපරිම ලකුණු 05

(ප්‍රායෝගික භාවිතය පිළිබඳව සළකා බලනු ලැබේ)

4. **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය** — උපරිම ලකුණු 05

(සන්නිවේදන කුසලතාවය සළකා බලනු ලැබේ)

5. **අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන** — උපරිම ලකුණු 05

5.1 පර්යේෂණ

i. තනි පුද්ගල පර්යේෂණ වාර්තා - ලකුණු 2.5 × 2
ii. කණ්ඩායම් පර්යේෂණ වාර්තා - ලකුණු 1.5 × 2

(පශ්චාත් උපාධියට / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ / නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට (Research Symposium) ඉදිරිපත් කරන ලද හෝ පර්යේෂණ සඟරාවක (Research Journal) පළ කරන ලද පර්යේෂණ වාර්තා සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)



Scanned with MOBILE SCANNER

5.2 පොත් හා සඟරා - ලකුණු 2.5 × 2

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මඟින් අනුමැතිය ලද තනි පුද්ගල කතෘ හිමිකාරීත්වයක් දරණ පොත් හා සඟරා සඳහා පමණක් ලකුණු ලබා දීමේදී සළකා බලනු ලැබේ)

* උපරිම පර්යේෂණ හා / හෝ ග්‍රන්ථ දෙකක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

5.3 අධ්‍යාපන ප්‍රකාශන සඳහා ලබා දෙන ලද වාර්තා හා ශාස්ත්‍රීය සංග්‍රහ එකකට ලකුණු 01 බැගින් උපරිම 05ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

**6. සේවා ඇගයීම** **උපරිම ලකුණු 05**

අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් සඳහා එකකට ලකුණු 01 බැගින් උපරිම සේවා ඇගයීම් 05ක් සඳහා

සටහන : දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු පළාත් ප්‍රධාන ලේකම්, පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, විභාග කොමසාරිස් ජනරාල් හෝ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් වේ.

**7. ඉදිරිපත් කිරීම** **උපරිම ලකුණු 10**

ඔබගේ ආයතනයේ, ඔබ විසින් රාජකාරි ඉටු කිරීමේදී, අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා මූලික වූ **කරුණක් / අවස්ථාවක්** පදනම් කරගෙන එය විශ්ලේෂණය කරමින් කරනු ලබන ඉදිරිපත් කිරීමක් සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

I. ප්‍රවේශය හා හැඳින්වීම - ලකුණු 2
II. අන්තර්ගතය - ලකුණු 2
III. කාල කළමනාකරණය - ලකුණු 2
IV. ඉදිරිපත් කිරීමේ විලාශය - ලකුණු 2
V. නිමාව හා නිගමනය - ලකුණු 2

ඒ සඳහා පරිගණක ආශ්‍රයෙන් (Power Point) හෝ වෙනත් සුදුසු මාධ්‍යයකින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර සිදු කරනු ලබන ඉදිරිපත් කිරීමට අදාළ දෘශ්‍ය පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දිය යුතු වේ.

**8. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබූ සමස්ථ කුසලතාව** **උපරිම ලකුණු 05**

**100**



Scanned with MOBILE SCANNER